**ජපන් තානාපති කාර්යාලය**

අංක 20, ග්‍රෙගරි පාර, කොළඹ 7
දුරකථන : +94-11-2693831~3, ෆැක්ස් : +94-11-2698629
ඊමේල් : cultujpn@co.mofa.go.jp

**පුවත්පත් නිවේදනය**

ජුලි 19, 2013

# නිදහස් හා සාධාරණ මැතිවරණයක් සහතික කිරීම සඳහා ජපන් රජය ආධාර ලබා දෙයි.

ජපන් රජය විසින් උතුරු පළාතේ ඡන්ද හිමියන්ගේ ඡන්ද අයිතිය පිලිබඳව දැනුවත් කිරීමටත්, මෑතකදී පළාත් සභා ඡන්දය පැවැත්වීමට නියමිත පළාත් සභා තුනෙහිම මැතිවරණ නිරීක්ෂණ කටයුතු සඳහාත් 'බිම් මට්ටමේ මානව සුරැකීමේ ආධාර ව්‍යාපෘතිය' (Grant Assistance for Grassroots Human Security Projects – GGP ) මගින් 'ඡන්ද ක්‍රියාවලියේ පුරවැසියාගේ සහභාගිත්වය සූදානම් කිරීම හා ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම' යන ව්‍යාපෘතිය යටතේ ඇමරිකානු ඩොලර් 88,667 (දළ වශයෙන් රුපියල් මිලියන 11.4) මුදලක් ලබා දීමට තීරණය කරන ලදී.

ශ්‍රී ලංකා රජය විසින් ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කිරීම සඳහා ගනු ලබන උත්සාහයට අනුග්‍රහය දක්වමින් ජපන් රජය විසින් මෙම ව්‍යාපෘතිය හරහා අරමුණු කරනුයේ 1988 පසු පළමුවරට සිය පළාත් සභා ඡන්දය භාවිතා කරන උතුරු පළාතේ ජනයාගේ ඡන්ද අයිතිය පිළිබඳ දැනුවත්භාවය වැඩි කිරීම හා උතුරු , වයඹ හා මධ්‍යම යන පළාත්වල නිදහස් හා සාධාරණ මැතිවරණයක් පැවැත්වීම සහතික කිරීමත්ය.

මෙම ව්‍යාපෘතිය යටතේ මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් වන PAFFREL සංවිධානය (නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා වූ ජනතා ක්‍රියාකාරීත්වය) විසින් මැතිවරණය සම්බන්ධ ක්‍රියාකාරකම් අපක්ෂපාතීව සිදු කරනු ඇත. 1987 සිට ලද සුවිශාල ප්‍රවීණයන්ගෙන් සැදුම්ලත් PAFFREL සංවිධානය විසින් පළාත් සභා ක්‍රමය පිළිබඳ උතුරු පළාතේ ඡන්ද හිමියන්

දැනුවත් කරනු ඇති අතර පළාත් තුනේම සෑම ඡන්ද මධ්‍යස්ථානයකම ඡන්ද නිරීක්ෂකයන්ට නිරීක්ෂණ කටයුතු සඳහා දායක වනු ඇත. මීට අමතරව ජනතාවගේ දේශපාලන අයිතීන් සුරක්ෂිත කිරීමේ භාරකරුවකු ලෙස ක්‍රියාකරන මැතිවරණ නිරීක්ෂකයන් පුහුණු කිරීමෙහිද PAFFREL සංවිධානය නියැලෙනු ඇත. හත්වෙනි වතාවටද ජපානය සමඟ සහයෝගයෙන් කටයුතු කරන PAFFREL සංවිධානය මෙමඟින් ශ්‍රී ලංකාවේ සාමය ශක්තිමත් කිරීම සඳහා ජපන් රජයේ ඇති කැපවීම ද මහජනයා වෙත ගෙන යනවා ඇත.

ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැඟීම, පුනරුත්ථාපනය හා නැවත ගොඩනැඟීම සඳහා කැපවෙන ජපන් රජයේ නියෝජිතයන් යසුෂි අකාශි මහතාගේ නායකත්වය යටතේ ශ්‍රී ලංකාවේ ජාතික සංහිඳියා ක්‍රියාවලිය ධෛර්යමත් කරමින් සිටී. 2013 මාර්තු මාසයේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා ජපානයේ සංචාරය කළ අතර ජපන් අගමැති අතිගරු ෂින්සො අබේ මහතා සමඟ සිදුවූ හමුවේදී උතුරු පළාතේ ඡන්දය පැවැත්වීම සම්බන්ධව තමාගේ ඇති ප්‍රබල කැපවීම අතිගරු ජනාධිපතිතුමා ප්‍රකාශ කළේය. ජුලි මස 05 වන දින ජනාධිපති අතිගරු මහින්ද රාජපක්ෂ මහතා විසින් උතුරු පළාත් සභා ඡන්දය පැවැත්වීම සඳහා ඡන්ද කොමසාරිස් වෙත ලබා දුන් ප්‍රකාශය ජපන් රජය අගය කරයි. උගත් පාඩම් හා ප්‍රතිසංවිධාන කොමිසමේ යෝජනා යථාර්ථයක් බවට පත්කර ගැනීම පිණිස මූලික ආරම්භයක් ලෙසත්, ශ්‍රී ලංකා රජය විසින් ජාතික සංහිඳියාව සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග අතර වැදගත් සංදිස්ථානයක් ලෙසත් මෙම මැතිවරණය වැදගත් වේ.

මෙම මැතිවරණය මුළුමනින්ම අභ්‍යන්තර ක්‍රියාවලියක් සේ හඳුනා ගනිමින් ජපන් රජය විසින් ලබා දෙන මැතිවරණ ආධාර බිම්මට්ටමේ මහජනයා වෙත කිසිදු අගතියක් තොරව PAFFREL සංවිධානය හරහා ළඟාවේ යැයි ද, එය දේශීය ජනයාගේ දේශපාලන සහභාගිත්වය සුරක්ෂිත කරනු ඇතැයිද ජපන් රජය බලාපොරොත්තු වේ. නිදහස් හා සාධාරණ මෙන්ම ප්‍රචණ්ඩත්වයෙන් තොර මැතිවරණ පැවැත්වීමට ශ්‍රී ලංකා රජය ගනු ලබන උත්සාහයන් මෙම ව්‍යාපෘතිය මඟින් තවදුරටත් ශක්තිමත් කරනු ඇතැයි ජපන් රජය අපේක්ෂා කරයි.

මෙම ව්‍යාපෘතිය සඳහා වූ මූල්‍ය ආධාර ගිවිසුම 2013 ජුලි මස 19 වන දින, ජපන් තානාපති නොබුහිතො හොබො මහතා සහ PAFFREL සංවිධානයේ විධායක අධ්‍යක්ෂ රොහාන් හෙට්ටිආරච්චි මහතා අතර, PAFFREL සංවිධානයේ සභාපතිනිය ජෙසිමා ඉස්මයිල් මහත්මියගේ සහභාගිත්වයෙන් කොළඹ ජපන් තානාපති නිල නිවසේදී අත්සන් තබන ලදි.


වැඩි විස්තර සඳහා, කරුණාකර විමසන්න

ආර්ථික සහයෝගිතා අංශය, ජපන් තානාපති කාර්යාලය

දුරකථන 011-2693831 දිගු අංකය 225

ඊ මේල් : cultujpn@co.mofa.go.jp